# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1704/11 – 2011 මැයි 04 වැනි බදාදා – 2011.05.04**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2011 අංක 77 දරන ආඥාව**

මගේ යොමු අංකය: එල්ඩී/05/2010/එච්ඩබ්/125.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: 3/2/5/5/2074-111.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2011 මාර්තු මස 30 වැනි දින,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
''ගොවිජන මන්දිරය'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා.**– ප්‍රාදේශීය ලේකම්, ජාඇල.

2. **ඉඩමේ විස්තරය.**– බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ, ජාඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රාගම්පත්තුව සුළු කොට්ඨාසයේ, ඉදිවිටිය ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක ගම්/ජා/2010/529 හා 2010.02.12 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 0.1021ක් පමණ වූ පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණවලින් යුත් ඉඩම් කොටස්වලට මායිම්:

01. **කැබලි අංක 01 – ප්‍රමාණය: හෙක්. 0.0081**

02. **කැබලි අංක 02 – ප්‍රමාණය: හෙක්. 0.0035**

03. **කැබලි අංක 03 – වැටකෙයියාගහකුඹුර – ප්‍රමාණය: හෙක්. 0.0154**
උතුරට: යෝජිත කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය, පාර, කැබලි අංක 2 (පාර) සහ පාර; නැගෙනහිරට: පාර සහ මෙම ඉඩමේ ඉතිරි කොටස සහ ඩබ්. ඒ. ජූඩ් දයාසිරි පෙරේරා හිමිකම් කියන වැටකෙයියාගහකුඹුර; දකුණට: ඩබ්. ඒ. ජූඩ් දයාසිරි පෙරේරා හිමිකම් කියන වැටකෙයියාගහකුඹුර, කැබලි අංක 4 සහ යෝජිත කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය; බටහිරට: යෝජිත කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය.

04. **කැබලි අංක 04 – වැටකෙයියාගහකුඹුර – ප්‍රමාණය: හෙක්. 0.0640**
උතුරට: යෝජිත කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය, අංක 3 සහ ඩබ්. ඇනී මේරි පෙරේරා හිමිකම් කියන වැටකෙයියාගහකුඹුර; නැගෙනහිරට: ඩබ්. ඇනී මේරි පෙරේරා හිමිකම් කියන වැටකෙයියාගහකුඹුර, මෙම ඉඩමේ ඉතිරි කොටස සහ හිමිකම් කියන අය සොයාගත නොහැකි වැටකෙයියාගහකුඹුර; දකුණට: හිමිකම් කියන අය සොයාගත නොහැකි වැටකෙයියාගහකුඹුර, කැබලි අංක 5 සහ යෝජිත කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය; බටහිරට: යෝජිත කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය.

05. **කැබලි අංක 05 – වැටකෙයියාගහකුඹුර – ප්‍රමාණය: හෙක්. 0.0111**
උතුරට: යෝජිත කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය, කැබලි අංක 4 සහ ඩබ්. ඒ. ජූඩ් දයාසිරි පෙරේරා හිමිකම් කියන වැටකෙයියාගහකුඹුර සහ මෙම ඉඩමේ ඉතිරි කොටස; නැගෙනහිරට: මෙම ඉඩමේ ඉතිරි කොටස;

දකුණට: මෙම ඉඩමේ ඉතිරි කොටස සහ යෝජිත කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය; බටහිරට: යෝජිත කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය.

05 - 404

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

### 2011 අංක 78 දරන ආඥාව

මගේ යොමු අංකය: එල්ඩී/05/2010/එච්ඩබ්/127.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: කැළ/7/ඉඅ/3/221.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2011 මාර්තු මස 30 වැනි දින,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
"ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා.**– ප්‍රාදේශීය ලේකම්, කැලණිය.

2. **ඉඩමේ විස්තරය.**– බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, කැලණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අධිකාරි පත්තුව සුළු කොට්ඨාසයේ, වෙඩිකන්ද ගමේ පිහිටි, සර්වේයර් ජනරාල්ගේ අංක ගම්/කැල/2010/346 හා 2011.01.09 දිනැති ප්‍රගමන අනුරේඛනයේ ප්‍රමාණයෙන් හෙක්. 1.3966ක් පමණ වූ පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුත් ඉඩම් කැබලිවලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – ඇළබොඩ කුඹුර – ප්‍රමාණය: හෙක්. 0.0451**
උතුරට: ගම් 2865 වැනි මූලික පිඹුරේ කැබලි අංක 39, මෙම ඉඩමේ ඉතිරි කොටස වූ හිමිකම් කියන අය සොයාගත නොහැකි ඇළබොඩ කුඹුර සහ කළුඔය; නැගෙනහිරට: කළු ඔය සහ කැබලි අක්ෂර බී; දකුණට: කැබලි අක්ෂර බී, ඇළ සහ ගම් 2865 වැනි මූලික පිඹුරේ 31; බටහිරට: ගම් 2865 වැනි මූලික පිඹුරේ 31 සහ කැබලි අංක 39.

02. **කැබලි අක්ෂර 'බී' – කළුඔය – ප්‍රමාණය: හෙක්. 1.1634**

03. **කැබලි අක්ෂර 'සී' – දන්ගහ කුඹුර – ප්‍රමාණය: හෙක්. 0.0272**
උතුරට: කැබලි අක්ෂර බී, කළු ඔය සහ මෙම ඉඩමේ ඉතිරි කොටස වූ හිමිකම් කියන අය සොයාගත නොහැකි දන්ගහ කුඹුර; නැගෙනහිරට: මෙම ඉඩමේ ඉතිරි කොටස වූ හිමිකම් කියන අය සොයාගත නොහැකි දන්ගහ කුඹුර; දකුණට: මෙම ඉඩමේ ඉතිරි කොටස වූ හිමිකම් කියන අය සොයාගත නොහැකි දන්ගහ කුඹුර, ඇළ, කැබලි අක්ෂර ඩී සහ බී; බටහිරට: කැබලි අක්ෂර ඩී සහ බී.

04. **කැබලි අක්ෂර 'ඩී' – ඇළ – ප්‍රමාණය: හෙක්. 0.0097**

05. **කැබලි අක්ෂර 'ඊ' – දන්ගහ කුඹුර – ප්‍රමාණය: හෙක්. 0.0099**
උතුරට: කැබලි අක්ෂර බී, ඩී සහ ඇළ; නැගෙනහිරට: මෙම ඉඩමේ ඉතිරි කොටස වූ හිමිකම් කියන අය සොයාගත නොහැකි දන්ගහ කුඹුර; දකුණට: මෙම ඉඩමේ ඉතිරි කොටස වූ හිමිකම් කියන අය සොයාගත නොහැකි දන්ගහ කුඹුර, කළු ඔය සහ කැබලි අක්ෂර බී; බටහිරට: කැබලි අක්ෂර බී.

06. **කැබලි අක්ෂර 'එෆ්' – දන්ගහ කුඹුර – ප්‍රමාණය: හෙක්. 0.0160**
උතුරට: කැබලි අක්ෂර බී, කළු ඔය, මෙම ඉඩමේ ඉතිරි කොටස වූ හිමිකම් කියන අය සොයාගත නොහැකි දන්ගහ කුඹුර; නැගෙනහිරට: මෙම ඉඩමේ ඉතිරි කොටස වූ හිමිකම් කියන අය සොයාගත නොහැකි දන්ගහ කුඹුර; දකුණට: මෙම ඉඩමේ ඉතිරි කොටස වූ හිමිකම් කියන අය සොයාගත නොහැකි දන්ගහ කුඹුර, කළු ඔය සහ කැබලි අක්ෂර බී; බටහිරට: කැබලි අක්ෂර බී.

07. **කැබලි අක්ෂර 'ජී' – දන්ගහ කුඹුර – ප්‍රමාණය: හෙක්. 0.0296**
උතුරට: 2874 මූලික පිඹුරේ කැබලි අංක 2, ඇළ කැබලි අක්ෂර එච් සහ බී; නැගෙනහිරට: කැබලි අක්ෂර බී; දකුණට: කැබලි අක්ෂර බී සහ කළු ඔය; බටහිරට: 2874 වැනි මූලික පිඹුරේ කැබලි අංක 2, ඇළ සහ කැබලි අක්ෂර එච්.

08. **කැබලි අක්ෂර 'එච්' – ඇළ – ප්‍රමාණය: හෙක්. 0.0035**

09. **කැබලි අක්ෂර 'අයි' – ඇළ – ප්‍රමාණය: හෙක්. 0.0922**
උතුරට: ගම් 2874 වැනි මූලික පිඹුරේ කැබලි අංක 2, ඇළ සහ කැබලි අක්ෂර බී; නැගෙනහිරට: කැබලි අක්ෂර බී සහ එච්; දකුණට: කැබලි අක්ෂර බී, එච් සහ ඇළ; බටහිරට: ගම් 2874 වැනි මූලික පිඹුරේ කැබලි අංක 2.

05 - 405

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 39අ(1) වැනි වගන්තිය යටතේ නියමය

2003 අගෝස්තු මස 05 වැනි දින අංක 1300/9 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද 2003 අංක 120 දරන (460 වන අධිකාරිය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාවෙන් මෙහි පහත I වන උපලේඛනයෙහි සඳහන් ඉඩම් කොටස් රජය වෙත සම්පූර්ණයෙන් ම සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටසේ සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් සංශෝධිත) 39අ(1) වැනි වගන්තියේ උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, පහත II උපලේඛනයෙහි සඳහන් ඉඩම් කොටස් මෙම නියමය මගින් අවසතු කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ අංකය: එල්.ඩී./5/2002/ඩබ්ලිව් එස්/269.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: බිය/1/1/240.
2011 මාර්තු මස 21 වැනි දින,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
අංක 80/5, 'ගොවිජන මන්දිරය',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

### I වන උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ බියගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අධිකාරි පත්තුව සුළු කොට්ඨාසයේ බොල්ලෑගල ගමේ පිහිටි ගම්පහ කොට්ඨාසය භාර මැනුම් අධිකාරි විසින් සකස් කර ඇති අංක ගම්/බිය/03/21 හා 2003.04.30 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අංක 1, 2 සහ 3 වශයෙන් පෙන්නුම් කර ඇති මුළු ප්‍රමාණයෙන් හෙක්. 1.513 වශයෙන් පමණ වූ පහත සඳහන් නම්වලින් ප්‍රමාණයන්ගෙන් සහ මායිම් වලින් යුක්ත ඉඩම් කොටස් 03:

01. **කැබලි අංක 01 – පැලවත්ත – ප්‍රමාණය: හෙක්. 0.726 ක් පමණ**
උතුරට: ඩබ්. ඩී. වයලට්, ඩබ්. ඩී. සුමනපාල සහ ඩබ්. ඩී. සිරියාවතී හිමිකම් කියන දික්ඕවිට *නොහොත්* ගොඩඋඩවත්ත; නැගෙනහිරට: එස්. ගුණසේකර හිමිකම් කියන පැලවත්ත සහ කැබලි අංක 2; දකුණට: කැළණි ගඟ; බටහිරට: එම්. ඒ ලීලාවතී හිමිකම් කියන පල්ලෑගලවත්ත.

02. **කැබලි අංක 02 – පැලවත්ත – ප්‍රමාණය: හෙක්. 0.742 ක් පමණ**
උතුරට: එස්. ගුණසේකර හිමිකම් කියන පැලවත්ත සහ ඇළ; නැගෙනහිරට: ඇළ සහ කැළණිගඟ; දකුණට: කැළණි ගඟ සහ කැබලි අංක 1; බටහිරට: කැබලි අංක 1 සහ එස් ගුණසේකර හිමිකම් කියන පැලවත්ත.

03. **කැබලි අංක 03 – දෙල්ගහවත්ත – ප්‍රමාණය: හෙක්. 0.045 ක් පමණ**
උතුරට: ඒ. සිරිරත්න පිගේරා හිමිකම් කියන දෙල්ගහවත්ත සහ පාර; නැගෙනහිරට: පාර, චින්තා කාරියප්පෙරුම හිමිකම් කියන දෙල්ගහවත්ත සහ කැළණි ගඟ; දකුණට: කැළණි ගඟ සහ ඇළ; බටහිරට: ඇළ සහ ඒ. සිරිරත්න පිගේරා හිමිකම් කියන දෙල්ගහවත්ත.

### II වන උපලේඛනය

ගම්පහ දිස්ත්‍රික්කයේ බියගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අධිකාරි පත්තුව සුළු කොට්ඨාසයේ බොල්ලෑගල ගමේ පිහිටි ගම්පහ කොට්ඨාස භාර මැනුම් අධිකාරි 2005.08.16 දිනැතිව සකස් කරන ලද අංක මු.පි. ගම්. 3398 දරන මූලික පිඹුරේ කැබලි අංක 02 සහ 03 වශයෙන් පෙන්නුම් කර ඇති මුළු ප්‍රමාණයෙන් හෙක්. 0.788 ක් පමණ වූ පහත නම්වලින් ප්‍රමාණයන්ගෙන් සහ මායිම් වලින් යුක්ත ඉඩම් කොටස් දෙක:

01. **කැබලි අංක 02 – පැලවත්ත – ප්‍රමාණය: හෙක්. 0.742 ක් පමණ**
උතුරට: එස්. ගුණසේකර හිමිකම් කියන පැලවත්ත සහ ඇළ; නැගෙනහිරට: ඇළ සහ කැළණි ගඟ; දකුණට: කැළණි ගඟ සහ කැබලි අංක 1; බටහිරට: කැබලි අංක 1 සහ එස් ගුණසේකර හිමිකම් කියන පැලවත්ත.

02. **කැබලි අංක 03 – දෙල්ගහවත්ත – ප්‍රමාණය: හෙක්. 0.046 ක් පමණ**
උතුරට: ඒ. සිරිරත්න පිගේරා හිමිකම් කියන දෙල්ගහවත්ත සහ පාර; නැගෙනහිරට: පාර, චින්තා කාරියප්පෙරුම හිමිකම් කියන දෙල්ගහවත්ත සහ කැළණි ගඟ; දකුණට: කැළණි ගඟ සහ ඇළ; බටහිරට: ඇළ සහ ඒ. සිරිරත්න පිගේරා හිමිකම් කියන දෙල්ගහවත්ත.

05 - 406

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.